ඉරිදා ලංකාදීප පුවත්පතේ (පෙබ. 12, 2023) සඳැල්ල අතිරේකය තුළ, රංගන ශිල්පිනියක සමඟින් සිදුකළ සාකච්ඡාවක්, "වේවා ශාන්ති නොවේවා කේන්ති" යන සිරස්තලය ඔස්සේ පළ කර තිබිණි. එම සාකච්ඡාවේදී, එම රංගන ශිල්පිනියගෙන් අසා තිබූ පැනයන් කිහිපයක් පහත පරිදි දැක්විය හැක.

* 'උඩරට' කෙනෙක් වෙච්ච නිසාද හර්ෂිකා මෙච්චර පැහැපත් වුණේ. නැත්නම් මේ දවස්වල බොහෝ දෙනා පාච්ච්චි කරනවා වගේ සුදුවෙන්න පෙති බොනවද?

* ඔච්චර පැහැපත් වෙලත් ඔයාට ටිකක් නපුරු වගේ චරිත නේද ලැබෙන්නේ? පෙම්වතියගේ චරිතය නැහැ නේද?

ඔබ සිතන ආකාරයට,

1) "උඩරට කෙනෙක්" නම් "පැහැපත්" වැනි ඒකාකෘතික කිරීමක් ඇති කිරීම ඔස්සේ, එකම රටක ජීවත් වන ප්‍රජාවන් අතර පවා කළු සුදු භේදයක් ප්‍රවර්ධනය නොවන්නේ ද?

2) "පැහැපත් වෙලත් පෙම්වතියගේ චරිතය ලැබෙන්නෙ නැහැ නේද" වැනි ප්‍රශ්නයක් ඇසීම ඔස්සේ, අදාළ මාධ්‍යවේදියා විසින් උත්සාහ කරන්නේ, රංගන ක්ෂේත්‍රය තුළ "පෙම්වතිය" වැනි චරිතයක් ලැබීමට නම්, "පැහැපත්" වීම අවශ්‍ය බව පැවසීමට ද? සමේ පැහැය එතරම් පැහැපත් නොවන අයෙකුට "පෙම්වතියගේ" වැනි චරිත නොලැබෙන්නේ ද? එය, "සුදු"/"පැහැපත්" වීම ලස්සන බවටත්, "කළු"/"පැහැයෙන් අඩු" වීම අවලස්සන බවටත් වන ඒකාකෘතික කිරීම තවදුරටත් ප්‍රවර්ධනය නොකරන්නේ ද?

3) රංගන ශිල්පිනියන් සමඟ කෙරෙන සාකච්ඡාවකදී ඉහත ආකාරයේ ප්‍රශ්න ඇසුණත්, රංගන ශිල්පීන් සමඟින් සිදුකෙරෙන මෙවැනිම සාකච්ඡාවන් තුළ, මෙවැනි ප්‍රශ්න ඇසෙන්නේ ද?

